# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 12 දරන පලාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සභානායකය සමගින් කළේ 1979 පෙබරවාරි මස 26 වන දින]

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

1979 මාර්තු මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 30 යි　　තැපැල් ගාස්තුව : ශත 25 යි

## 1979 අංක 12 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 පෙබරවාරි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 12/79.

**1979 අංක 3 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 12 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1979 අංක 3 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ දීර්ඝ නාමය එහි "සේවයෙන් පහ කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ" යන වචන වෙනුවට "සේවයෙන් පහ කිරීමට සහ ඒවාට සම්බන්ධ වූ හෝ ඒවාට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — *1979 අංක 3 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.*

*"පනත අදාළ කිරීම.*

2. මේ පනත මෙහි මින් මතු "මේ පනත අදාළ වන්නා වූ තැනැත්තා" යනුවෙන් හඳුන්වනු ලබන—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවයෙහි සාමාජිකයකු නොවන, යම් පළාත් පාලන ආයතනයක සෑම නිලධරයකුට ම සහ සේවකයකුට ම ;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවයෙහි සාමාජිකයකු නොවන, යම් පළාත් පාලන ආයතනයක නිලධරයකුව, නැතහොත් සේවකයකුව යම් අවස්ථාවක සිටියා වූ ද, සේවය අවසන් කරනු ලැබ නැතහොත් ඒ සේවයෙන් විශ්‍රාම ගෙන ඇත්තා වූ ද, සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් හෝ තමාට ලැබිය යුතු යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් නැතහොත් විශ්‍රාම යාමේ දීමනාවක් නොගෙවීම හෝ ඒ විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය නැතහොත් විශ්‍රාම යාමේ දීමනාව ප්‍රමාණවත් නොවීම හෝ සම්බන්ධයෙන් ඉල්ලීමක් යම් කම්කරු විනිශ්චය අධිකාරයක විභාග

ඒ—39716—12,400 (79/02)

කරනු ලැබීමට ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වන්නා වූ ද සෑම තැනැත්තකුට ම; සහ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවයෙහි සාමාජිකයකු නොවන්නාවූ ද, 1978 ජූලි මස 8 වන දිනයෙන් පසු සහ 1979 ජනවාරි මස 9 වන දිනට පෙර යම් අවස්ථාවක යම් පළාත් පාලන ආයතනයක සේවයෙන් විශ්‍රාම ගෙන ඇත්තා වූ හෝ යම් පළාත් පාලන ආයතනයක් විසින් සේවය අවසන් කරනු ලැබ ඇත්තා වූ ද පළාත් පාලන ආයතනයක සෑම නිලධරයකුට ම හෝ සේවකයකුට ම

අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් ප්‍රස්තුත පළාත් පාලන ආයතනය විසින් විනයානුකූලව කටයුතු කරනු ලැබූ හෝ ඔහුගේ සේවාවන් අවසන් කරනු ලැබූ අවස්ථාවක දී" යන වචන වෙනුවට "යම් තැනැත්තකු සම්බන්ධයෙන් ප්‍රස්තුත පළාත් පාලන ආයතනය විසින් විනයානුකූලව කටයුතු කර ඇති හෝ විනයානුකූලව කටයුතු කරනු ලබන නැතහොත් ඔහුගේ සේවාවන් අවසන් කර ඇති හෝ ඔහුගේ සේවාවන් අවසන් කරනු ලබන අවස්ථාවක දී" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "සේවානියුක්තයා" යන වචනය වෙනුවට "තැනැත්තා" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "සේවානියුක්තයන්ගේ" යන වචනය වෙනුවට "තැනැත්තන්ගේ" යන වචනය ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "යම් සේවා නියුක්තයකු යම් පළාත් පාලන ආයතනයක සේවයෙන් විශ්‍රාම ගනු ලැබ, ඔහුට ලැබිය යුතු යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම දීමනාවක් නොගෙවීම නිසා හෝ ඒ විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ විශ්‍රාම දීමනාව ප්‍රමාණවත් නොවීම නිසා අතෘප්තියට පත්වන්නා වූ අවස්ථාවක" යන වචන වෙනුවට "යම් තැනැත්තකු යම් පළාත් පාලන ආයතනයක සේවයෙන් විශ්‍රාම ගනු

ලැබ ඇත්තා වූ නැතහොත් විශ්‍රාම ගනු ලබන්නා වූ ද ඔහුට ලැබිය යුතු යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම දීමනාවක් නොගෙවීම නිසා හෝ ඒ විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ විශ්‍රාම දීමනාව ප්‍රමාණවත් නොවීම නිසා අතෘප්තියට පත් වන්නා වූ ද අවස්ථාවක," යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "සේවා නියුක්තයා" යන වචනය වෙනුවට "නැනැත්තා" යන වචනය ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "සේවානියුක්තයා" යන වචනය වෙනුවට "නැනැත්තා" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "යම් සේවා නියුක්තයකුට" යන වචන වෙනුවට "යම් නැනැත්තකුට" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "සේවානියුක්තයකු" යන වචනය වෙනුවට "නැනැත්තකු" යන වචනය ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "සේවානියුක්තයකු" යන වචනය වෙනුවට "නැනැත්තකු" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "සේවානියුක්තයන්ට" යන වචනය වෙනුවට "නැනැත්තන්ට" යන වචනය ආදේශ කිරීමෙන්.

8. මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1979 ජනවාරි මස 9 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

මේ පනත අතීතයට බලපෑම.